# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

### මානවශාස්ත්‍ර පීඨය

### ප්‍රාසංගික කලා (පැරණි නිර්දේශය)

### ඉන්දියාවේ සම්භාව්‍ය නර්තන සහ සංගීත සම්ප්‍රදා - PART E3015

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. වෛදික සාහිත්‍යයේ අන්තර්ගත සංගීත මූලයන් හඳුන්වා දෙන්න.

02. නාට්‍යශාස්ත්‍රයේ හෝ සංගීතරත්නාකරයේ සංගීතමය සාධක විමසන්න.

03. සම්භාව්‍ය සංගීත සම්ප්‍රදා ගැමි සංගීත සම්ප්‍රදාවලින් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

04. කෙටි සටහන් ලියන්න.

    1. ධ්‍රැපද් වානී සම්ප්‍රදා
    2. තරාණා සහ තිල්ලානා
    3. ගමක ප්‍රකාර
    4. සරාණා සම්ප්‍රදා
    5. අර්ධ ශාස්ත්‍රීය සංගීතය

05. සෛද්ධාන්තික කරුණු මත පදනම් ව කර්ණාටක සංගීතය සහ හින්දුස්ථානී සංගීතය තුලනාත්මකව විමර්ශනය කරන්න.

06. "මෝගල් පාලන සමය කථක් නර්තනයේ පරිවර්තිත අවධියකි." විමසන්න.

07. ඉන්දීය නර්තනයේ උපයුක්ත නෘත්ත, නෘත්‍ය, නාට්‍ය සංකල්පය ඔබ උගත් එක් නර්තන සම්ප්‍රදායක් ඇසුරින් විමසුමක යෙදෙන්න.

08. වීර කාව්‍ය සාහිත්‍ය අර්ථ සන්නිවේදනයෙහි ලා කථකලි නෘත්‍ය නාටකයෙහි භාවිත වේශභූෂණ ක්‍රමෝපායන් පිළිබඳ විමසුමක යෙදෙන්න.

09. භූගෝලීය සාධක හා ආගමික සංකල්ප මණිපුරි නර්තන සම්ප්‍රදායේ ප්‍රභවය හා සංවර්ධනය කෙරෙහි ඉවහල් වී ඇති ආකාරය පිළිබඳ විමසුමක යෙදෙන්න.

10. "කථකලි කේරළයේ ප්‍රචලිත ගැමි නාටකවල ආකෘතික ලක්ෂණ ඇසුරෙන් නිර්මාණය කර ගන්නා ලද්දකි." විමසන්න.

**********************************